*STAY AWARE OF THE FIRE DANGER RATING AND KNOW WHAT TO DO.*

# FIRE DANGER RATING සම්බන්ධයෙන් දැනුවත්වීම සහ කල යුතු දේ දැනගැනීම

Fire Danger Rating මගින් ගින්නක් නිවා දැමීමට ඇති අපහසුතාවය ඇතුළුව එය ඇතිවූ පසු හැසිරෙන ආකාරය කල් ඇතිව කියාදේ.

ඇගයීම (rating) වැඩිවන තරමට ඇතිවන තත්වයන්ගේ භායානකකම වැඩිවේ. ඔබ හට ක්‍රියාත්මක වීම සඳහා හේතුවන කරුණ, ඇගයීම වන බැවින් ඔබගේ දිස්ත්‍රික්කයේ Fire Danger Rating සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටිය යුතුය. ගිනි සමයේදී, පුවත් සහ කාලගුණ නිවේදනවල Fire Danger Rating විශේෂ ලක්ෂණයක්වේ.

ගිනි සමයේදී, Fire Danger Rating කාලගුණ අනාවැකිවල විශේෂ ලක්ෂණයක් වන අතර, ගුවන් විදුලිය සහ රූපවාහිණී මගින් ප්‍රචාරය කරන අතර සමහර පුවත්පත්වලද පළ කෙරේ.

CFA, Department of Sustainability and Environment සහ Bureau of Meteorology වෙබ් අඩවි වෙත යාමෙන්ද, දුරකථන අංක 1800 240 667 ඔස්සේ Victorian Bushfire Information Line හෝ දුරකථන අංක 1800 555 677 ඔස්සේ National Relay Service ඇමතීම මගින්ද එය සොයාගත හැකිවේ.




| | මෙයින් අදහස් වන්නේ කුමක්ද? | මා කුමක් කල යුතුද? |
|---|---|---|
| **CODE RED** | ❯ ලැව්ගින්නක් (bush) හෝ තණකොළ ගින්නක් (grassfire) සම්බන්ධයෙන් මේවා නරකම තත්වයන්වේ.<br>❯ මෙම තත්වයන් යටතේ ගිනිවලට මුහුණ දීමට නිවෙස් සැලසුම්කර හෝ ගොඩනගා නැත.<br>❯ වඩාත්ම ආරක්ෂාකාරී ස්ථානය වන්නේ වඩා වැඩි අවදානම් සහිත ලැව්ගිනි (bushfire) ප්‍රදේශවලින් ඈත්ව සිටීමවේ. | ❯ වඩාත්ම ආරක්ෂාකාරී විකල්පය වන්නේ වඩා වැඩි අවදානම් සහිත ලැව්ගිනි (bushfire) ප්‍රදේශවලින් පෙරදා රාත්‍රියේ හෝ අදාල දින උදෑසනම ඉවත්ව යාමවේ - රැඳී සිට බලමින් ඉන්න එපා.<br>❯ කැළෑ සහිත ප්‍රදේශ, ඝණ පඳුරු හෝ දිගු වියළි තණකොළ මග හරින්න.<br>❯ ඔබ කටයුතු කල යුතු අවස්ථාව දැනගන්න - පහත කරුණු සම්බන්ධ තීරණ ගන්නඃ<br>– ඔබ ඉවත්ව යන වේලාව<br>– ඔබ යන ස්ථානය<br>– ඔබ එහි යන ආකාරය<br>– ඔබ නැවත එන වේලාව<br>– ඔබට ඉවත්වා යාමට නොහැකි නම්, ඔබ කරන දෙය. |
| **EXTREME** | ❯ ඉතා දරුණු උණුසුම්, වියළි සහ සුළං සහිත තත්වයන් බලාපොරොත්තුවන්න.<br>❯ ගින්නක් ඇතිවී දිගටම පැවතුනහොත්, එය පාලනය කර ගත නොහැකි, අනපේක්ෂිත සහ වේගයෙන් ගමන් කරනු ඇත. ක්ෂණිකව ඇතිවන ගිනි (Spot fires) ඇතිවී වේගයෙන් ගමන්කර විවිධ දිශාවලින් පැමිණිය හැකිය.<br>❯ ලැව්ගින්නකට (bushfire) ඔරොත්තුදෙන ආකාරයට පිහිටා ඇති සහ ගොඩනැගූ හෝ නවීකරණය කල හොඳින් පිළියෙල කල සහ සක්‍රීය ලෙස ආරක්ෂා කල නිවෙස් මගින් ආරක්ෂාව සැපයිය හැකිවේ.<br>❯ මෙම තත්වයන් යටතේ ඔබගේ නිවෙස ආරක්ෂා කර ගැනීමට ඔබ භෞතික වශයෙන් සහ මානසික වශයෙන් සූදානම්ව සිටිය යුතුය. | ❯ ඔබ ඉහලම මට්ටමට සූදානම් නම් පමණක් ඔබගේ දේපළේ රැඳී සිටීමට සලකා බලන්න. මෙයින් අදහස් වන්නේ ඔබගේ නිවෙස ලැව්ගින්නකට (bushfire) ඔරොත්තු දන ආකාරයට පිහිටා ඇති සහ ගොඩනැගූ හෝ නවීකරණය කල එකක් වන අතර ගින්නක් ඇතිවුවහොත් හොඳින් සූදානම්වී සහ සක්‍රීය ලෙස ඔබගේ නිවස ආරක්ෂා කිරීමට ඔබට හැකි විය යුතුය.<br>❯ ඔබ ඉහළම මට්ටමට සූදානම්වී නොමැතිනම්, ඔබට ඇති හොඳම විකල්පය වන්නේ අදාල දින උදෑසනම ලැව්ගිනි (bushfire) සම්බන්ධ වැඩි අවදානමක් ඇති ප්‍රදේශවලින් ඉවත්ව යාමවේ.<br>❯ පළාතේ තත්වයන් ගැන අවබෝධයෙන් සිටින්න. ABC ප්‍රදේශීය ගුවන් විදුලිය, වාණිජ සහ නම්කරන ලද ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථාන ඇසීම මගින් හෝ Sky News TV බැලීම මගින් හෝ **cfa.vic.gov.au** වෙබ් අඩවිය වෙත යාම මගින් හෝ **1800 240 667** දුරකථන අංක ඔස්සේ Victorian Bushfire Information Line හෝ දුරකථන අංක **1800 555 677** ඔස්සේ National Relay Service ඇමතීම මගින් විස්තර සොයා ගන්න. |
| **SEVERE** | ❯ උණුසුම්, වියළි සහ සමහර අවස්ථාවල සුළං සහිත තත්වයන් බලාපොරොත්තුවන්න.<br>❯ ගින්නක් ඇතිවී දිගටම පැවතුනහොත්, එය පාලනය කර ගත නොහැකි විය හැකිය.<br>❯ හොඳින් පිළියෙල කල සහ සක්‍රීය ලෙස ආරක්ෂා කල නිවෙස් මගින් ආරක්ෂාව සැපයිය හැකිවේ.<br>❯ මෙම තත්වයන් යටතේ ඔබගේ නිවෙස ආරක්ෂා කර ගැනීමට ඔබ භෞතික සහ මානසික වශයෙන් සූදානම්ව සිටිය යුතුය. | ❯ සක්‍රිය ලෙස ආරක්ෂා කරන ලද හොඳින් සූදානම් කල නිවෙස් මගින් ආරක්ෂාව ලබා දිය හැකිවිය හැකිය - ඔබගේ ලැව්ගිනිවලින් බේරීමේ සැලැස්ම (Bushfire Survival Plan) බලන්න.<br>❯ ඔබ සූදානම් නොමැතිනම්, ඔබට ඇති ආරක්ෂාකාරීම විකල්පය වන්නේ අදාල දින උදෑසනම ලැව්ගිනි සම්බන්ධයෙන් අවදානම (bushfire-prone) ඇති ප්‍රදේශයෙන් ඉවත්ව යාමවේ.<br>❯ පළාතේ තත්වයන් ගැන අවබෝධයෙන් සිටින්න. ABC ප්‍රදේශීය ගුවන් විදුලිය, වාණිජ සහ නම්කරන ලද ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථාන ඇසීම මගින් හෝ Sky News TV බැලීම මගින් හෝ **cfa.vic.gov.au** වෙබ් අඩවිය වෙත යාම මගින් හෝ **1800 240 667** දුරකථන අංක ඔස්සේ Victorian Bushfire Information Line හෝ දුරකථන අංක **1800 555 677** ඔස්සේ National Relay Service ඇමතීම මගින් විස්තර සොයා ගන්න. |
| **VERY HIGH**<br>**HIGH**<br>**LOW-MODERATE** | ❯ ගින්නක් ඇතිවුවහොත්, මෙම තත්වයන් යටතේ බොහෝ විට එය පාලනය කරගත හැකිවනු ඇති.<br>❯ ගිනි ඇතිවිය හැක්කේ කෙසේද යන්න සම්බන්ධයෙන් අවබෝධයෙන් සිට අවදානම අවම කර ගන්න.<br>❯ ආරක්ෂාකාරී නම්, පාලනය කල තත්ව යටතේ පිළිස්සීම (controlled burning off) සිදුවිය හැකිය - බලපත්‍ර ලබාගත යුතුද යන්න සොයා බලන්න. | ❯ ඔබගේ ලැව්ගිනිවලින් බේරීමේ සැලැස්ම (Bushfire Survival Plan) බලන්න.<br>❯ තත්වයන් සමාලෝචනය කරන්න.<br>❯ ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය විය හැකිය.<br>❯ අවශ්‍ය නම් ඉවත්ව යන්න. |

වැඩිදුර විස්තර සඳහාඃ **1800 240 667** හෝ **1800 555 677** (National Relay Service) හෝ **cfa.vic.gov.au**